2024.09

Learning Resource Centre
De Mazenod College
Kandana

# මීගමුව අධ්‍යාපන කලාපය
## දෙවන වාර ඇගයීම 2024
## බුද්ධ ධර්මය
## 11 ශ්‍රේණිය

කාලය පැය 03 යි    විභාග අංකය ....................

පොදු උපදෙස්
- අංක 01 සිට 40 දක්වා ප්‍රශ්නවලට දී ඇති පිළිතුරු අතරින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.

## I කොටස

01. බුද්ධත්වය අවබෝධ කරගත් තමන් වහන්සේට සෙවන ලබාදුන් බෝධීන් වහන්සේ දෙස සතියක් ඇසිපිය නොහෙළා බලා සිටීමෙන් බුදුරදුන් ලොවට දුන් මහඟු ආදර්ශය වූයේ,
    i. පිදිය යුත්තන් පිදීමයි.    ii. කළගුණ සැලකීමයි.
    iii. අභියෝගවලට මුහුණ දීමයි.    iv. මිත්‍රශීලීව කටයුතු කිරීමයි.

02. බුදුරජාණන් වහන්සේ තම පළමු ධර්ම දේශනය පවත්වන ලද්දේ,
    i. ඉසිපතනය මිගදායේ දීය.    ii. විශාලාවේ කූඨාගාර ලෙනෙහි දීය.
    iii. රජගහනුවර වේළුවනාරාමයේ දීය.    iv. රජගහනුවර ජේතවනාරාමයේ දීය.

03. "මෙවන් පුතෙකු ලද මවක් පියෙක් නිවුණෝ වෙති" යනුවෙන් නිබ්බුත පද ගායනා කරන ලද්දේ,
    i. සුජාතා සිටු දියණිය විසිනි.    ii. විශාඛා උපාසිකාව විසිනි.
    iii. කිසාගෝතමිය විසිනි.    iv. යශෝදරා දේවිය විසිනි.

04. බුදු සසුනෙහි පැවිද්ද ලැබීමෙන් අනතුරුව අගසව් තනතුරු වලින් පිදුම් ලැබුවේ,
    i. සුනීත - සෝපාක යන දෙදෙනාය.    ii. උපතිස්ස - කෝලිත යන දෙදෙනාය.
    iii. අනේපිඬු සිටු - විශාඛාව යන දෙදෙනාය.    iv. රාහුල - නන්ද යන දෙදෙනාය.

05. කළහකාරීව හැසිරුණු භික්ෂු පිරිසකට බුදුරදුන් විසින් දේශනා කරන ලද " සමග්ගා හෝථ මා විවදථ" යන්නෙහි අර්ථය සහිත නිවැරදි වරණය තෝරන්න.
    i. සමගියම බලය වේ.    ii. සමගිය සතුට ගෙන දේ.
    iii. සමගියම යහපතකි.    iv. සමගිවන්න. විවාද නොකරන්න.

06. බුදුරජාණන් වහන්සේ සතු ගිලනුන්ට උපස්ථාන කිරීමේ බුදු ගුණය හා සම්බන්ධ නිදසුනක් වන්නේ,
    i. මට්ටකුණ්ඩලී කතා පුවත    ii. රජ්ජුමාලා කතා පුවත
    iii. පූතිගත්තතිස්ස තෙරුන්ගේ කතා පුවත    iv. අංගුලිමාල කතා පුවත

07. කිසියම් විශේෂිත පුද්ගලයෙකු හෝ පිරිසක් අරභයා එම ස්ථානයට බුදු රදුන් වැඩම කරවීම .......................... නමින් හැඳින්වේ.
    i. නිබද්ධ චාරිකා    ii. අනිබද්ධ චාරිකා    iii. ගමික චාරිකා    iv. අතුරිත චාරිකා

08. සංග්‍රාම භූමියක සිටින ඇතෙකුට සතුරාගෙන් හී පාරවල් කොතරම් වැදුණද පසු පසට ගමන් නොකොට ඉදිරියටම ගමන් කරන්නාක් සේ නින්දා ප්‍රශංසා හමුවේ නොසැලී ඉදිරියටම ගමන් කිරීමේ අපූර්ව හැකියාවක් බුදුරදුන් සතුව පැවතුණි. මේ ගුණය,
    i. මහා කරුණා ගුණය නම් වේ.    ii. අසරණ සරණ ගුණය නම් වේ.
    iii. පුරිසදම්මසාරථී ගුණය නම් වේ.    iv. තාදී ගුණය නම් වේ.

09. බුද්ධත්වය ප්‍රාර්ථනා කරන බෝසත් උතුමන් විසින් පුරනු ලබන උතුම් පිළිවෙත් සමූහය,
i. චතුරාර්ය සත්‍ය නම් වේ.
ii. පාරමිතා නම් වේ.
iii. මධ්‍යම ප්‍රතිපදාව නම් වේ.
iv. සේඛියා ධර්ම නම් වේ.

10. බුදු දහමට අනුව "කුසල්" යන්නෙහි අර්ථය සමඟ වඩාත් ගැලපෙන යෙදුම් ඇතුළත් වරණය තෝරන්න.
i. නිරෝගී, නිවහල්, දක්ෂ
ii. නිවහල්, නිදහස්, දක්ෂ
iii. නිරෝගී, නිවැරදි, දක්ෂ
iv. නිවැරදි, දක්ෂ, අනලස්

11. පංච නීවරණ ධර්ම අතර එන "කාමච්ඡන්ද" යන්නෙහි නිවැරදි අර්ථය වන්නේ,
i. කාම වස්තූන් පිනවීමට ඇති වන ආශාවයි.
ii. වැරදි කාම සේවනයෙන් මිදීමට ඇති කැමැත්තයි.
iii. කාම වස්තූන් පිළිබඳ ඇති වන කුතුහලයයි.
iv. පංචකාම සම්පත්තියෙන් මිදීමට ඇතිවන ආශාවයි.

12. සුමනපාල උපාසකතුමා නිරන්තරයෙන්ම තෙරුවන් පිළිබඳ පහන් හැඟීමෙන් යුතුව කටයුතු කරන්නෙකි. බුදු දහමේ එන පුද්ගල චරිත වර්ගීකරණයට අනුව ඔහුගේ චරිතය,
i. බුද්ධි චරිතයකි.
ii. විතර්ක චරිතයකි.
iii. රාග චරිතයකි.
iv. සද්ධා චරිතයකි.

13. ඕල්කට්තුමාගේ මූලිකත්වයෙන් "පරම විඥානාර්ථ" බෞද්ධ සමාගම පිහිටුවීමේ ප්‍රතිඵලයක් ලෙස ආරම්භ වූ පුවත්පත වූයේ,
i. බුද්ධාලෝකය
ii. සරසවි සඳරැස
iii. ඥානාර්ථ ප්‍රදීපය
iv. සිංහල බෞද්ධයා

14. දුටුගැමුණු රජතුමාගේ ශාසනික ඉදිකිරීම් අතරට අයත් නොවන ශාසනික ඉදිකිරීම කුමක්ද?
i. මිරිසවැටිය
ii. රුවන්වැලි සෑය
iii. අභයගිරිය
iv. ලෝවාමහාපාය

15. "අත්තනාව කතං පාපං - අත්තනා සංකිලිස්සති" යන ධම්ම පද ගාථා පාඨයේ අර්ථය සමඟ ගැලපෙන ප්‍රකාශය තෝරන්න.
i. ශුද්ධිය හෝ අශුද්ධිය අනුන්ගෙන් ලද නොහැකිය.
ii. තමා පහනක් කොට වාසය කරන්න.
iii. තමා තමා කෙරෙහිම විශ්වාසයෙන් කටයුතු කරන්න.
iv. තමා පව් කළොත් ඉන් තමාවම කෙලෙසෙන්නේය.

16. බෞද්ධයාගේ හස්තසාර ග්‍රන්ථය ලෙස සැලකෙන ධම්මපදය අයත් වන්නේ සූත්‍ර පිටකයේ,
i. දීඝනිකායට ය.
ii. මජ්ඣිම නිකායට ය.
iii. අංගුත්තර නිකායට ය.
iv. ඛුද්දක නිකායට ය.

17. ධම්ම පද දේශනාවට අනුව සෑම දෙයක් පිළිබඳවම "විමසා බලා කටයුතු කිරීම" හඳුන්වා ඇත්තේ,
i. "සඤ්ඤත "යනුවෙනි.
ii. "නිසම්මකාරී" යනුවෙනි.
iii. "සුචිකම්ම" යනුවෙනි.
iv. "සතිමතෝ" යනුවෙනි.

18. සමාජය තුළ ශිෂ්ට සම්මත යහපත් අඹුසැමි සබඳතාවයක් පවත්වාගෙන යාම සඳහා වඩා වැදගත් වන්නේ,
i. පාපමිත්‍ර සේවනයෙන් වැළකී සිටීමයි.
ii. නිවැරදි ජීවන වෘත්තීන්ගෙන් වැළකී සිටීමයි.
iii. වැරදි කාම සේවනයෙන් වැළකී සිටීමයි.
iv. මුලාවට පත් වීමෙන් වැළකී සිටීමයි.

19. බුදුරජාණන් වහන්සේ දීඝජානුකෝලිය සිටු පුත්‍රයා උදෙසා දේශනා කරන ලද සූත්‍ර දේශනාව වනුයේ,
i. ව්‍යග්ඝපජ්ජ සූත්‍රය යි.
ii. සිගාලෝවාද සූත්‍රය යි.
iii. චූල්ලකම්ම විභංග සූත්‍රය යි.
iv. දම්සක් පැවතුම් සූත්‍රය යි.

20. පරාභව සූත්‍රයේ දක්වා ඇති ධනය විනාශ වීමට හේතු වන දූර්තභාවයන් අතරට අයත් නොවන කරුණ වන්නේ,
   i. සුරාවට ලොල් වීම.   ii. පාපමිත්‍ර සේවනයට ලොල් වීම.
   iii. සූදුවට ලොල් වීම.   iv. ස්ත්‍රීන්ට ලොල් වීම.

21. බෞද්ධ දේශනාවට අනුව නොකළ යුතු දේ නොකිරීමත්, කළ යුතු දේ කිරීමත් .................. යනුවෙන් හඳුන්වා ඇත.
   i. හිරි ඔතප්ප   ii. අධිපති ධර්මය   iii. විරමනය හා සමාදානය   iv. අත්තූපනායික ධර්මය

22. සිගාලෝවාද සූත්‍රයේ සදිසා නමස්කාරයට අනුව ගුරුවරුන් සහ ශිෂ්‍යයින් දක්වා ඇත්තේ,
   i. නැගෙනහිර දිසාවෙනි.   ii. දකුණු දිසාවෙනි.   iii. බටහිර දිසාවෙනි.   iv. උතුරු දිසාවෙනි.

23. බුදුරජාණන් වහන්සේ විසින් දේශනා කරන මහා මංගල සූත්‍රයේ දී පුද්ගලයාගේ දියුණුවට අදාළ උතුම් මංගල කරුණු ...................... දක්වා ඇත
   i. 12   ii. 21   iii. 38   iv. 61

24. පුද්ගලයාගේ පිරිහීමට හේතු කවරේදැයි පැහැදිලි කරමින් බුදුරදුන් විසින් "පරාභව සූත්‍රය" දේශනා කරන ලද්දේ,
   i. සිටුවරයෙකු ඇසූ ප්‍රශ්නයකට පිළිතුරු වශයෙනි.   ii. ගුරුවරයෙකු ඇසූ ප්‍රශ්නයකට පිළිතුරු වශයෙනි.
   iii. බ්‍රාහ්මණයෙකු ඇසූ ප්‍රශ්නයකට පිළිතුරු වශයෙනි.   iv. දෙවියකු ඇසූ ප්‍රශ්නයකට පිළිතුරු වශයෙනි.

25. බුදුරජාණන් වහන්සේ කාලාම වැසියන් අරභයා **"යමක් එකහෙලාම නොපිළිගත යුතු යැයි"** දේශනා කළ කරුණු අතරට අයත් නොවන්නේ,
   i. "මිතුරෙකුගේ කීම නිසා හෝ" යන්නයි.   ii. "ආරංචි මාත්‍රයෙන් නිසා හෝ" යන්නයි.
   iii. "පරම්පාරාවෙන් පැවත එන නිසා හෝ" යන්නයි.   iv. "තර්කානුකූල නිසා හෝ" යන්නයි.

26. සමගියෙන් හා සතුටින් විවාද නොකර, කිරි සහ ජලය මෙන් පෑහී, එකමුතුව, එකිනෙකා දෙස ප්‍රිය ඇසින් බලමින් ජීවත්වීම බුදු දහමේ හඳුන්වා ඇත්තේ,
   i. සහබන්ධනය ලෙස ය.   ii. සහජීවනය ලෙස ය.   iii.සහනශීලී බව ලෙස ය.   iv. සහෝදරත්වය ලෙසය.

27. අනුන්ගේ දුක දැක හදවතේ අනුකම්පා සිතිවිලි ජනිත කර ගැනීම,
   i. මෙත්තා නම් වේ.   ii. කරුණා නම් වේ.   iii. මුදිතා නම් වේ.   iv.උපේක්ෂා නම් වේ.

28. බෞද්ධ විග්‍රහයට අනුව කර්මය යන්නට දිය හැකි වඩාත් නිවැරදිම අර්ථය සහිත ප්‍රකාශය පහත වරණ අතරින් තෝරන්න,
   i. සියලු පුද්ගල ක්‍රියා කර්මය නම් වේ.   ii. සියලු කායික ක්‍රියා කර්මය නම් වේ.
   iii.සියලු සචේතනික ක්‍රියා කර්මය නම් වේ.   iv. සියලු චේතනාවන් කර්මය නම් වේ.

29. බුදුදහමට අනුව කුසලාකුසල කර්ම විනිශ්චයේදී වඩාත් මූලික වන්නේ,
   i. සිත යි.   ii. කය යි.   iii. වචනය යි.   iv. තුන්දොර යි.

30. බුදුරදුන් සතු වූ ත්‍රිවිද්‍යා ඥාන අතරින් "සත්වයන්ගේ පෙර භවයන් පිළිබඳ දැකීමේ නුවණ" හඳුන්වනු ලබන්නේ,
   i. පුබ්බේනිවාසානුස්සති ඤාණය ලෙසය.   ii. චුතූපපාත ඤාණය ලෙසය.
   iii. ආසවක්ඛය ඤාණය ලෙසය.   iv. දිබ්බ චක්ඛු ඤාණය ලෙසය.

31. කර්මය සහ කර්ම විපාක පැහැදිලි කරමින් බුදු රදුන් විසින් දේශනා කරන ලද චූල්ලකම්ම විභංග සූත්‍රයට අනුව "ප්‍රාණඝාතය කරන්නා"...............................
   i. අල්ප භෝගීව උපදී.   ii. දූර්වර්ණව උපදී.   iii. ආබාධ සහිතව උපදී.   iv. අඩු වයසින් මිය යයි.

32. දස කුසල් අතර එන "අභිධ්‍යාව" යන්නෙහි අර්ථය වන්නේ
i. දැඩි තරහවයි ii. දැඩි ලෝභයයි iii. වැරදි දැකීමයි iv.වැරදි හැසිරීමයි.

33. මට්ටකුණ්ඩලී නම් තරුණයා මරණාසන්න මොහොතෙහි බුදු රදුන් දැක සිත පහදවා ගත් පිනෙහි ප්‍රතිඵලයක් ලෙස දිව්‍ය ලෝකයේ ඉපදීම වඩාත් අදාළ වන්නේ,
i. අහෝසි කර්මයට යි. ii. ආසන්න කර්මයට යි. iii. ආචිණ්ණ කර්මයට යි. iv.කටත්තා කර්මයට යි.

34. සංජය පිරිවැජියා අතහැර සත්‍ය සොයා ගිය කෝලිත - උපතිස්ස දෙදෙනාට බුදු දහමෙහි හරය පහදා දෙන්නේ,
i. ආනන්ද හිමියන්ය. ii. සැරියුත් හිමියන් ය. iii.අස්සජි හිමියන්ය. iv. මහා කාශ්‍යප හිමියන්ය.

35. "අනුලෝම පටිච්චසමුප්පාදය" යන්නට ගැලපෙන නිවැරදි ප්‍රකාශය පහත වරණ අතරින් තෝරන්න.
i. මෙය ඇති කල්හි මෙය ඇත. ii. මෙය ඇති කල්හි මෙය නැත.
iii.මෙය නැති කල්හි මෙය ඇත. iv. මෙය නැති කල්හි මෙය නැත.

36. බුදු දහමට අනුව "උපාදානය" යන්නෙහි අර්ථය වන්නේ,
i. සසර ඉපදීමයි. ii. සිතෙහි උපදින ආශාවයි.
iii. අරමුණු පහළ වීමයි. iv. සිතින් දැඩිව අල්ලා ගැනීමයි.

37. තණ්හාව මුල් කර ගෙන සමාජයේ කල කෝලාහල ඇතිවන අයුරු පටිච්චසමුප්පාදයට අනුව පෙන්වා දී ඇති සූත්‍ර දේශනාවක් වන්නේ,
i. චක්කවත්ති සීහනාද සූත්‍රය ii. මහා නිදාන සූත්‍රය
iii. අග්ගිවත්තගොච්ච සූත්‍රය iv. සිගාලෝවාද සූත්‍රය

38. "බාහිර බලවේග අනුව සියල්ල සිදුවේය" යන ඉගැන්වීම් බැහැර කරන බුදු දහම සියල්ල..........................යන ඉගැන්වීම ප්‍රධාන කරගත් දහමකි,
i. දෙවියන්ගේ කැමැත්ත අනුව සිදුවේ. ii.පෙර කරන ලද කර්මය අනුව සිදුවේ.
iii. හේතුඵල න්‍යාය ධර්මය අනුව සිදුවේ. iv.කිසිදු හේතුවකින් තොරව සිදුවේ.

39. ලක්දිව ප්‍රසිද්ධ බෞද්ධ ස්ථූප කීපයක් පහත දැක්වේ.

A - රුවන්වැලි සෑය
B - ථූපාරාමය
C - මහියංගන ස්ථූපය
D - අභයගිරිය

ඉහත ස්තූප අතරින් "බුබ්බුලාකාර" ස්තූප ආකෘතියට නිදසුනක් ලෙස දැක්විය හැක්කේ,
i. A සහ C ii. B සහ C iii. B සහ D iv. A සහ D

40. "අඩ්ඪචන්දපාසාණ" යනුවෙන් හඳුන්වන බෞද්ධ කලා නිර්මාණය වන්නේ,
i. සඳකඩපහණ ii. මුරගල iii. වටදාගෙය iv. වාහල්කඩ

(ලකුණු 1 x 40 = 40)

REGISTRAR
De Mazenod College
Kandana.

2024.09

# මීගමුව අධ්‍යාපන කලාපය
## දෙවන වාර ඇගයීම 2024
## බුද්ධ ධර්මය
## 11 ශ්‍රේණිය

විභාග අංකය ....................

Learning Resource Center
De Mazenod College
Kandana

පොදු උපදෙස්
- පළමුවැනි ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් ද ඇතුළුව ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න
- පළමුවැනි ප්‍රශ්නයට ලකුණු 20 ද තෝරාගන්නා අනෙක් ප්‍රශ්නයකට ලකුණු 10 ද බැගින් ද හිමි වේ.

## II කොටස

01. i. බුදුරදුන්ගේ පළමු ධර්ම දේශනය දේශනා කරන ලද්දේ කවුරුන් හටද?
ii. අසරණ සරණ බුදු ගුණයට අදාළ නිදසුන් දෙකක් ගෙන හැර දක්වන්න.
iii. තුන්තරා බෝධිය නම් කරන්න.
iv. පංචස්කන්ධයෙන් දෙකක් නම් කරන්න.
v. බුදු දහමට අනුව "සීලය" යනු කුමක්දැයි කෙටියෙන් දක්වන්න.
vi. "කාලා රස මුසු හෝජන කර පෙම් - ගාලා සුවඳැති සඳුනුත් මනරම් .........." යන පද්‍ය ඇතුළත්වන ග්‍රන්ථය සහ එහි කතුවරයා නම් කරන්න.
vii. කාලාම සූත්‍රයෙන් හෙළිකරන වෙනත් කිසිදු ආගමක දක්නට නොලැබෙන බුදු දහමට පමණක් විශේෂිත වූ කාරණය කුමක්ද ?
viii. වෙනත් සත්ව වර්ග අතර ජීව විද්‍යාත්මක වෙනස්කම් පැවතිය ද මිනිසා පිළිබඳව එබඳු වෙනස්කම් දැක්විය නොහැකි බව අවධාරණය කරනු ලබන සූත්‍ර දේශනාව කුමක්ද ?
ix. "චේතනාහං භික්ඛවේ කම්මං වදාමි...." යන පාලි පාඨයේ අර්ථය ලියන්න.
x. සතර සංග්‍රහ වස්තු අතරින් දෙකක් නම් කරන්න. (ලකුණු 2 x 10 = 20 )

02. i. දස පාරමිතා අතරින් දෙකක් නම් කරන්න.
ii. ඔබ විසින් ඉහත (i) හි නම් කරන ලද එක් පාරමිතාවක් නිදසුන් සපයමින් හඳුන්වා දෙන්න.
iii. සදාචාරවත් සමාජයකට පාරමිතා ගුණ ධර්ම ඉවහල් වන අයුරු පාරමිතා ධර්ම දෙකක් නිදසුන් වශයෙන් ගෙන පහදන්න. (ලකුණු 2+3+5 = 10)

03. i. " නතං කම්මං කතං සාධු......" යන ධම්මපද ගාථාව සම්පූර්ණ කරන්න.
ii. එම ගාථාවේ තේරුම ලියන්න.
iii. පුද්ගල ජීවිතය සාර්ථක කර ගැනීමට උපදෙස් සපයන වටිනා ග්‍රන්ථයක් ලෙස ධම්මපදය ඇගයීමට ලක් කරන්න. (ලකුණු 2+3+5 = 10)

04. i. ව්‍යග්ඝපජ්ජ සූත්‍රයේ දී බුදු රදුන් විසින් "දීඝජානු" නම් කෝලිය පුත්‍රයා උදෙසා පුද්ගලයාගේ මෙලොව හිතසුව පිණිස හේතුවන කරුණු හතරක් දක්වා ඇත. ඉන් දෙකක් නම් කරන්න.
ii. එම කරුණු අතරින් එකක් කෙටියෙන් පහදන්න.
iii. පුද්ගලයාගේ මෙලොව ජීවිතය සාර්ථක කර ගැනීමට එම කරුණු හේතු වන අයුරු පැහැදිලි කරන්න. (ලකුණු 2+3+5 = 10)

05. i. සීල ශික්ෂාවට අයත් වන ආර්ය අෂ්ටාංගික මාර්ගයේ අංග දෙකක් නම් කරන්න.
ii. පංච සීලයෙහි පළමු ශික්ෂා පද තුන පිළිවෙළින් ලියා දක්වන්න.
iii. පන්සිල් ආරක්ෂා කිරීමෙන් සිදුවන සමාජමය යහපත පිළිබඳ විස්තරයක් කරන්න. (ලකුණු 2+3+5 = 10)

06. i. "අවිජ්ජා පච්චයා සංඛාරා" යන්නෙහි අර්ථය ලියා දක්වන්න.
ii. අනුලෝම පටිච්චසමුප්පාදය හා ප්‍රතිලෝම පටිච්චසමුප්පාදය යන්න හඳුන්වා දෙන්න.
iii. ශිෂ්‍ය ජීවිතයේදී ඔබ මුහුණ දෙන ගැටළු විසඳා ගැනීමේදී පටිච්චසමුප්පාද න්‍යාය උපයෝගි කර ගත හැකි අයුරු පෙන්වා දෙන්න. (ලකුණු 2+3+5 = 10)

07. පහත සඳහන් මාතෘකා දෙකකට කෙටි සටහන් ලියන්න.
i. පුරිසදම්ම සාරථී ගුණය
ii. රේරුකානේ චන්ද්‍රවිමල හිමි
iii. සහජීවනය
vi. විදර්ශනා භාවනා

(ලකුණු 5 + 5 = 10)

REGISTRAR
De Mazenod College
Kandana.